බලංගොඩ නගර සභාව

රත්නපුර දිස්ත්‍රික්කය

--------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

-------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 01 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජුනි 29 දින සභාවේ ලේකම්වරියට යවා ඇත.

1.2 මතය

------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට බලංගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රජ්‍ය අංශයේ ගිණුම්කරන ප්‍රමිත වලට අණුකුලව සත්‍ය සාධාරන තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

බලංගොඩ නගරයේ වැසි ජල අපහරණ කානු පද්ධතිය අළුත්වැඩියා කිරීම සඳහා දේශීය ණය හා සංවර්ධන අරමුදලින් 2004 දෙසැම්බර් 31 ලද රු.8,815,586 ක් වූ ණය මුදල සහ එම ණය වෙනුවෙන් ගෙවිය යුතු රු.7,228,781 ක් වූ පොලිය අවසන් ගිණුම්වල පෙන්වා නොතිබුණි.

1.3.2 නොසැසඳු පාලන ගිණුම්

-------------------------

2014 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව අතැති තොග ශේෂයේ වටිනාකම රු.1,771,399 ක් වුවද අවසන් ගිණුම් වාර්තාව අනුව රු.611,727 ක් වීමෙන් තොග වටිනාකම රු.1,159,672 ක නොසැසඳුණු වෙනසක් පැවතුණි.

1.3.3 ලැබියයුතු සහ ගෙවිය යුතු ගිණුම්

--------------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු ජාතිය ගොඩනැගීමේ බදු රු.1,206,874 ක් ගෙවා නොතිබුණි.

(ආ) ලැබිය යුතු යන්ත්‍ර කුලී රු.93,133 ක් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

1.3.4 බැංකු ගිණුම්

------------------

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) බැංකු ගිණුම් 05 කට අදාලව පිළියෙල කල බැංකු සැසඳුම් හි දිගින් දිගටම නිරවුල් නොවූ එකතුව රු. 3,923,114 ක් වු ශේෂ පැවතුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට වු බැංකු සැසඳුම් වාර්තා අනුව තැන්පත් කර අගරු වු රු.846,494 ක් වටිනා චෙක්පත් 20 ක් සම්බන්ධව ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 189 හා 486 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) 2014 දෙසැම්බර් 31 දිනට වු බැංකු සැසඳුම් වාර්තා අනුව අදාල චෙක්පත නිකුත් කල දින සිට මාස 06 කට වැඩි කාලයක් ඉක්මවු එකතුව රු.1,193,433 ක් වටිනා චෙක්පත් 32 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

1.3.5 නීතිරීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

----------------------------------------------------

සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂය තුල දී මිලදී ගත් රු.922,750 ක් වටිනා පරිගණක හා උපාංග සහ 2014 වර්ෂයේ පරිත්‍යාග ලෙස ලද රු54,125 වටිනා පරිගණක උපාංග, 2002/11/28 දිනැති අංක IAI/2002/02 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛ විධිවිධාන පරිදි පරිගණක හා උපාංග ලේඛනයට ඇතුලත් කර නොතිබුණි.

02. මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 7,159,897ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.7,207,355ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 47,458ක වර්ධනයක් ඇති වී තිබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

------------------------------------

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වරිපනම් හා බදු රු.771,390 කින්ද, ආදායම් ආධාර රු.7,931,089 කින්ද , වෙනත් ආදායම් රු. 2,966,800 කින් හා වරෙන්තු ගාස්තු දඩ හා දඩුවම් රු.168,244 කින් වැඩිවීමත්, ගමන් වියදම් , ප්‍රවාහන සම්බන්ධතා, අවශ්‍යතා හා වෙනත් සේවා හා පොලි ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් ගෙවීම් රු.1,722,535 කින් අඩුවී තිබීමත් ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

-----------------------

2.3.1. ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

-----------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විග්‍රහයක් පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම (රු.) | 2014 හා ඊට පෙර වර්ෂ සඳහා තත්‍ය ලැබීම් (රු) | දෙසැම්බර් 31 දිනට හිඟය (රු) |
|---|---|---|---|
| | 000 | 000 | 000 |
| වරිපනම් හා බදු | 6,800 | 7,225 | 860 |
| බදු කුලී | 8,201 | 7,537 | 1,316 |
| වෙනත් ආදායම් | | | |
| බදු කුලී-සභාව සතු දේපල (3.0.324) | 64 | 51 | 64 |
| තානායම් ගාස්තු | 16,000 | 15,433 | 566 |
| විවෘත වෙළඳ ස්ථාන කඩ කුලී (3.0.322.1) | 1,398 | 1,438 | 140 |
| පදික කඩ (5.0.323.1) | 4,165 | 4,278 | 127 |

2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

----------------------------------

(අ) 2014 අගෝස්තු 01 දින සිට 2014 දෙසැම්බර් මස 31 දක්වා අයවිය යුතු උසාවි දඩ මුදල් ගණනය කර පළාත් පාලන කොමසාරිස්ගෙන් අයකර ගැනිමට කටයුතු කර නොතිබූ අතර 2012 අප්‍රේල් 01 දින සිට 2014 ජුලි 30 දින දක්වා ලැබිය යුතු උසාවි දඩ මුදලෙන් රු.647,244 ක් අයවී නොතිබුණි.

(ආ) 2014 අප්‍රේල් මස 01 සිට 2014 දෙසැම්බර් 31 දින තෙක් අයවිය යුතු මුද්දර ගාස්තු ගණනය කර පාළාත් පාලන කොමසාරිස්ගෙන් අයකර ගැනිමට කටයුතු කර ක්‍රියාකර නොතිබුණි.

03 පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) ප්‍රතිපාදන උපයෝජනය